# ශාකයයි සංස්කෘතියයි



විශ්‍රාමලත් විදුහල්පති
ශාස්ත්‍රවේදී
නා.ලි. සාර්ලිස් අමරසිරි

## තිපල

විශේෂයෙන් දේශීය වෛද්‍යකර්ම වලදී අරළු, බුළු, නෙල්ලි බහුල වශයෙන් යොදා ගැනෙන, පල වර්ග තුනකි. විශේෂ කොට සඳහන් කර නැතිනම් ඔසු පිණිස ගන්නේ ගෙඩියේ ලෙල්ලයි. ඇසට හිතකර තිපල තුන්දොස් සමනය කරයි. හරීතකී, අභය ආදී නම් වලින් අරළුත්, විභීතකී, භූතවාශ යන නම් වලින් බුළුත්, ආමලකී, අමෘතඵල නම් වලින් නෙල්ලිත් හැඳින්වේ.

භූතයන් වෙසෙන ගසක් හැටියට ප්‍රකට බුළු මිහිරි හා සිසිල් නිසා පිත දුරලයි. කසට හා කටුක නිසා සෙම් දුරලයි. දුටුගැමුණු රජු සමයේ අනුරාධපුරයේ ඇති වූ

## අරළු, බුළු, නෙල්ලි

කසට හා මිහිරි රස ඇති අරළු උදර විරේක ඔසුවකි. නුවණ වඩයි. කුෂ්ට, උණ, පාණ්ඩු, ඇස් ඉස් ලෙඩ,



කාමිලා, ග්‍රහණි ඉදිමුන්, ස්වාස, මුල, වමන, භගන්දරා, ගුල්ම, ප්‍රතිෂ්‍ය ආදී සියළු රෝගයනට හිතකර වේ. තුන්දොසම නසයි.

"උනමීලනී බුද්ධි බලේන්ද්‍රියානනං
සංමීලනී පිත්ත කපානිලා නාම්
සංසෝධනී මුත්‍ර මලාසයානං
හරිතකී ශාන්තිකරී නරානාං"

හැම රසයක්ම ඇති නෙල්ලි කටුක තිත්ත බැවින් සෙම් නසයි. කසට මිහිරි රස නිසා පිත නසාලයි. අම්ල රස නිසා වාතය දුරලයි. ඇසට හිතකරයි.

එක් සාගතයක් බුළුකෘ සාගතය නමින් හැඳින්විණි. දුර්භික්ෂය බලවත් වූයෙන් භික්ෂූණ් වහන්සේලා බුළු පොතු අනුභව කළ බව වංශ කථාවල සඳහන්ව ඇත.

ශිසට කෙසට හිත ඇති පීනස සුවකරන භෘංගාමලක තෛලය සඳහා යොදාගන්නා නෙල්ලි සමඟ රසකිඳ තම්බා බීමෙන් තුන්දොස් නිවී යන බව පිළිගැනේ.

යම් අදහසක පැහැදිලි බව සඳහන් කරන විට

"අතට ගත් නෙල්ලි ගෙඩියක් සේ"
"හස්තාමලකයක් සේ"
යන උපමා යොදන්නට අපි පුරුදු වී සිටිමු.

ධර්මාශෝක රජතුමාට භික්ෂූන්ට දන්දීම සඳහා යමක් ඉතිරිව නොතිබුණු වේලාවක නෙල්ලි ගෙඩියක් දුන් බව සඳහන්ව ඇත.

සිරුරට විරේකයක් අවශ්‍ය වූ විටෙක ඇල් විරේකය සාදාගෙන පානය කිරීමට මිනිස්සු පුරුදු වී සිටිති. තැඹිලි ගෙඩියක ඇස්ස කපා ඒ තුළට අරළු කලං 6 ක් හා සූකිරි කලං 6ක් දමා වසා රෑට පින්නේ තබා පසුදා උදය පෙරා බීමෙන් හොඳින් උදරය විරේක වෙයි. ඇස් රෝග වලදී තිබල් කසාය පානයටත් ඇසට දැමීමටත් සුදුසු බව දේශිය වෙදකමේ දැක්වේ. එබැවින් තිපල සිංහලයා ගේ ප්‍රත්‍යක්ෂ ඖෂධයකි. දේශීය වෛද්‍යවරයාට ගුලි, කල්ක, කසාය, තෛල, අරිෂ්ඨ ආදිය නිශ්පාදනයේදී තිපල බහුල වශයෙන් යෙදෙන ඔසු සංයෝගයකි.

Kandy

**House for Sale**

6 Bedroom luxury house with a panoramic view in Kandy

I km away from new court complex
All bedrooms have attached bathrooms
Double garage
Rooftop garden
Security system with CCTV

**32 million rupees or nearest Offer**

0094777386070 / 0094778659358
raviwithanarachchi@yahoo.com




## මනෝධ්‍යා... ඔබ දුන් ආදර්ශය රටක් වටියි..

මම විවිධාකාර උපන්දින සාද වලට සහභාගිවී ඇත්තෙමි. ඒ සියල්ල එකම අච්චුවේ ය. මේස අතරින් දෙගොඩ තලා ගලා යන ඕපා දූප ගංගා ය. දෝරෙ ගලනා මධු පැන් ය. කඳු ගැසුණ ආහාර බඳුන් ය. කන් පුපුරවන සංගීතයය.

එහෙත් ඊයේ රෑ සහභාගි වූ උපන්දින සාදය ඒ සියල්ලට වඩා වෙස් එකකි. එය සාදයක් කියා කීවාට සාදයක් නොවේ. දියණියකගේ 21 වන උපන්දිනය වෙනුවෙන් පැවැත්වුණ පිරිත් දේශනාවකි.

සිය යහළු යෙහෙළියන් 21 වන උපන්දින වෙනුවෙන් නිස්සාර සාද පවත්වද්දී වික්ටෝරියාවේ එපින් හි මනෝධ්‍යා හසිනි පෙරේරා දියණිය සැමට ආදර්ශයක් ගත හැකි තීරණයක් ගෙන තිබුණා ය.

"මගේ උපන්දිනයට පිරිත් අහන්න එන්න.. ඒත් මට තෑගි ගේන්න එපා.. තෑගි ගේන්න හිතනවා නම් ඒ වැය කරන්න අදහස් කරන මුදල් ලංකාවේ දුප්පත් නංගි ගෙනෙකුගේ අධ්‍යාපනය වෙනුවෙන් යොදන්නට අපි එකතු කරමු.." ඒ මනෝධ්‍යා ගේ ඉල්ලීමයි.

ශ්‍රී ලංකාවේ අන්ධ දෙමාපිය යුවලකගේ දෙවන දියණිය වූ එකොළොස් හැවිරිදි රසානි දිලනිකා නම් වන දැරියක ඉතා දුකසේ අධ්‍යාපනය ලබා පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වය සමත්ව සිටියා ය. තමන්ගේ 21 වන උපන් දිනය වෙනුවෙන් මේ දැරියගේ අධ්‍යාපනයට අත දෙන්නට මනෝධ්‍යා තීරණය කර තිබුණි. පැමිණි හිතවත්තු තමන්ට හැකි පමණින් මේ අරමුදලට ආධාර කර පිරිත් අසා සැනසීමක් ලබා ගත්හ.

මේ දරුවන් මෙලෙස ආදර්ශමත් ලෙස කටයුතු කරන්නේ ඔවුන්ට දෙමාපියන්ගෙන් ලැබුණ මග පෙන්වීම නිසා විය යුතු යයි පිරිත් සජ්ජායනය ආරම්භ කරන්නට පෙර කෝට්ටේ සන්තින්ද්‍රිය අපේ හාමුදුරුවන් නිවැරදිවම කී කතාවට අපිද සියයට සියයක්ම එකඟ වෙමු. ඒ දෙමාපියෝද පැසසුම් ලැබිය යුත්තෝ වෙති. බර්ගර්ස් දෙක තුනක් කන්නට වැය කරන මුදලින් ලංකාවේ අහිංසක දරු දැරියන් දින ගණන් සති ගණන් මාස ගණන් ජීවත් වන බව දරුවන්ට කියා දිය යුත්තේ දෙමාපියන් ය.

මනෝධ්‍යා ගේ 21 වන උපන්දිනය ඇයට සදා මතකයේ රැඳෙන ගෞරවණීය උපන්දිනයක් වූ බව ලියා තබන්නට කැමැත්තෙමි. ඔබ දුන් ආදර්ශය රටක් වටියි.

## Private Numbers සහ Blocked Numbers

විවිධාකාර හේතු කාරණා නිසා තමන්ගේ දුරකතන අංකය සඟවා තබාගන්නට අපේ සමහර හිතවත්තු පෙළඹී සිටිති. එහි කිසිදු වරදක් නැත. එය අයිතිවාසිකමකි. තමන්ගේ අනන්‍යතාව සඟවාගන්නට ඕනෑම කෙනෙකුට ඇති අයිතියට අපි ගරු කළ යුත්තෙමු.

එහෙත් මේ ගැනත් සිතන්න.

ඔබේ දුරකතන ඇමතුම ලබන්නාටත් දුරකතන ඇමතුමට කතා කරන්නට පෙර තමාට මේ ඇමතුම දෙන්නේ කවුරුන්දැයි  දැනගන්නට අයිතියක් ඇත. ඒ ඇමතුම ලබන්නාගේ අයිතියයි. මම මින්පසු ඒ අයිතිවාසිකම භුක්ති විඳින්නට තීරණය කර ඇත්තෙමි. Private Numbers වලින් හෝ Blocked Numbers වලින් හෝ ලැබෙන දුරකතන ඇමතුම් වලට මා පිළිතුරු නොදෙන්නේ ඒ අයිතිවාසිකම නිසා ය. ඒ ගැන මා සමග උරණ නොවන්නැයි ඉතා ආදරයෙන් ඉල්ලා සිටින්නෙමි.

**Vacancy**

**Air Conditioning Technician**

Sydney

සිඩ්නි නගරයේ සිට සේවය කිරීම සඳහා වායු සමීකරණ කාර්මික ශිල්පියකු අවශ්‍යව ඇත.

අදම විමසන්න

**Noel Air Con Pty Ltd**

**0411 112 990**